# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1947/26 - 2015 දෙසැම්බර් මස 29 වැනි අඟහරුවාදා - 2015.12.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, එය 2014 ඔක්තෝබර් මස 16 වන දින සිට ක්‍රියාත්මක වේ. දීර්ඝ කාලීන ජාතික අවශ්‍යතාවයක් ව පැවති මෙම ප්‍රතිපත්තිමය ඉදිරි සැලැස්ම, ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්ති රාමුව තුළ ජාතික හා පළාත් බලධාරීන්ට හා අනෙකුත් අදාළ පාර්ශවකරුවන්ට එය ක්‍රියාවට නැගීමට අවශ්‍ය මාර්ගෝපදේශනය සපයනු ඇත.

අනුර ජයවික්‍රම,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 23 වන දින,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පූර්විකාව

ශ්‍රී ලංකාව ප්‍රජා සෞඛ්‍යයට වැදගත් එන්නත් මගින් වලක්වා ගත හැකි රෝග වලින් තොර රටක් බිහි කිරීමේ දැක්මෙන් යුතුව රටේ සියලුම ප්‍රතිශක්තිකරණය ලබා ගැනීම සඳහා යෝග්‍ය පුද්ගලයන්ට අවශ්‍ය ප්‍රතිශක්තිකරණ සේවාවන් ලබා දීම සඳහා සුදුසු පරිසරයක් සහතික කිරීමේ ජාතික මෙහෙවර විෂයෙහි ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ශ්‍රී ලංකාව මානව සංවර්ධනයෙහි කැපී පෙනෙන දියුණුවක් ලබා ඇති අතර 2014 මානව සංවර්ධන දර්ශක වාර්තාවට අනුව ශ්‍රී ලංකාව 73 වන ස්ථානයට පත් වෙමින් දකුණු ආසියානු කලාපයේ ප්‍රථම ස්ථානයට පත්ව ඇති අතර මෙරට ඇතැම් සෞඛ්‍ය දර්ශකයන් ලොව දියුණු රටවල් හා සැසඳිය හැකි මට්ටමක පවතී. විශේෂයෙන් ළදරුවන්, කුඩා දරුවන්, ගර්භනී කාන්තාවන් හා පොදුවේ සමස්ථ ප්‍රජාවම ආවරණය කර ගනිමින් පුළුල්ව විසිරුනු ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනද විශිෂ්ඨ ප්‍රගතියක් ලබා ඇත. ගුණාත්මක මෙන්ම සුරක්ෂිත එන්නත් වල පැවැත්ම, කාර්යක්ෂම සේවා සැපයුම, එන්නත් සුදුසු උෂ්ණත්වයේ පවත්වා ගැනීමේ හැකියාව, ඒවා නිසි වෙලාවට සේවා පද්ධතිය තුළ බෙදා හැරීම, රෝග පතනය හා අහිතකර බලපෑම් මත පදනම් ව එම එන්නත් හඳුන්වා දීම, ප්‍රතිශක්තිකරණ සුරක්ෂිතතාව හා කාර්යක්ෂමතාව ඇති කිරීම යනාදී ප්‍රධාන අංගයන් සැලසුම් කිරීම හා කළමණාකරණය කිරීම අරමුණු කොට ගත් මෙම වැඩ පිළිවෙල මගින් ජනතාවට නොමිලයේ සේවා සපයන මනාව ස්ථාපිත වූ සෞඛ්‍ය සේවාවක් ලබා දීම ප්‍රධාන අරමුණ වන අතර ඒ තුළින් ජාතික ප්‍රතිශක්තිකරණ වැඩ සටහන තවදුරටත් උපරිම ඵලදායීතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් සිදු කිරීමට එහි ඇතුළත්ව ඇති සියලුම අංග අපේක්ෂිත මට්ටමක පවත්වා ගැනීමටත් රාජ්‍ය අංශයේ නිදහස් ප්‍රතිශක්තිකරණ සේවාව ශක්තිමත් කරන අතරම පුද්ගලික අංශය මගින් ලබා දෙන සේවාවන් හි ගුණාත්මක බව හා ප්‍රමිතිය සහතික කිරීමට නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමටත් මෙම ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය මගින් අවස්ථාව සැලසෙනු ඇත.

**ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය**

2014

***සෞඛ්‍ය අමාත්‍යාංශය***

***ශ්‍රී ලංකාව***

වර්ෂ 2014 ඔක්තෝබර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය අනුමත කරන ලදී.

***පසුබිම***

සියලු පුරවැසියනට ප්‍රතිශක්තිකරණය ලබාදීම සහතික කිරීමේ අධිකාරි බලය හා වගකීම අදාළ රජය සතුය. මේ සඳහා ලොවපුරා විවිධ රටවල, ස්වාධීන වූ කල් පවත්නා හා කාර්යක්ෂම ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී.

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ද රටට විශේෂිත වූ එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග නිවාරණය කිරීම අරමුණු කර ගොඩනැගුවකි. මේ වන විට සෑම එන්නතක් සඳහාම ඉහළ ප්‍රතිශක්තිකරණ ආවරණයක් ලබා ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන විශිෂ්ඨ ප්‍රගතියක් ලබා ඇත. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාප්තිත ප්‍රතිශක්තිකරණ වැඩසටහනින් (EPI) ආවරණය කරනු ලබන එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග රාශියක් වාර්ෂික පතනය (Incidence) ඉතාමත් අවම මට්ටමක පවත්වා ගැනීමට හැකි වී ඇත.

ගුණාත්මක මෙන්ම සුරක්ෂිත එන්නත්වල පැවැත්ම, කාර්යක්ෂම සේවා සැපයුම, එන්නත් සුදුසු උෂ්ණත්වයක පවත්වා ගැනීමේ හැකියාව (ශීත දාමය/cold chain) සහ ඒවා නිසි වේලාවට සේවා පද්ධතිය තුළ බෙදා හැරීම, (මනා සංවිධානය/Iogistics), රෝග පතනය හා අහිතකර බලපෑම මත පදනම්ව නව එන්නත් හඳුන්වා දීම, ප්‍රතිශක්තිකරණ සුරක්ෂිතතාවය හා කාර්යක්ෂමතාව ආවේක්ෂණය, දක්ෂ පුහුණු සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක සේවාව, පර්යේෂණ, ප්‍රමාණවත් අරමුදල් පැවතීම, උද්දේශනය (advocacy), කාර්යක්ෂම සන්නිවේදනය සහ වැඩසටහන සැලසුම් කිරීම හා කළමනාකරණය රටක මනාව ක්‍රියාත්මක වන ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනක ප්‍රධාන අංග වේ.

රටකට ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දීමේ ප්‍රධාන අරමුණ වනුයේ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට ඇතුළත් විය යුතු ඉහතින් සඳහන් කළ සියලුම අංග අපේක්ෂිත මට්ටමක පැවතීම තුළින් එහි අරමුණු සහ අභිමතාර්ථ උපරිම ලෙස ළඟා කර ගැනීම සහතික කිරීම වේ.

මීට අමතරව, ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය රටේ අනෙකුත් අදාළ ප්‍රතිපත්තීන් සමග සලකා බැලිය යුතු අතර එය සාධක සහ ආචාරධර්ම මත පදනම් වූ ද, සමානාත්මතාවය, රාජ්‍ය හා පෞද්ගලික දායකත්වයේ වැදගත්කම හඳුනා ගන්නා වූද බහු ක්ෂේත්‍ර සහ බහු විෂයන් අන්තර්ගත ප්‍රතිපත්තියක් විය යුතු ය.

***ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන***

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට ඇතුළත් සියලුම එන්නත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝවන රෝග පිළිබඳ ජාතික උපදේශක කමිටුව මගින් අනුමත ප්‍රතිශක්තිකරණ කාලසටහනකට අනුව සකස් කර ඇත. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට ඇතුලත් විය යුතු එන්නත් වර්ග සහ එය ලබාදිය යුතු වයස් සීමාවන්, පදනම් වනුයේ අදාළ රෝගය මගින් සමාජයට ඇතිවන අහිතකර බලපෑම (disease burden), අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන සැපයීමේ හැකියාව, එය ක්‍රියාත්මක කිරීමේ හැකියාව සහ එමගින් ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ අපේක්ෂිත අරමුණු කොතරම් දුරට සාක්ෂාත් කරගත හැකිවේද යන කරුණු මතය.

අධි අවදානම්/අවදානමට ලක්විය හැකි කාණ්ඩ සඳහා වූ ප්‍රතිශක්තිකරණය (ප්‍රතිශක්තිය ඌණ පුද්ගලයන්, නොමේරූ ළදරුවන්, ගර්භනී මව්වරුන්, වෘත්තීය රෝගවලට නිරාවරණය වීමේ අවදානම ඇති පුද්ගල කණ්ඩායම්) සහ විශේෂ අවස්ථාවලදී සිදුකරන ප්‍රතිශක්තිකරණය (ආපදා අවස්ථාවලදී, වසංගත අවස්ථාවන්හිදී, සංචාරයේ යෙදෙන්නන් රෝගවලට නිරාවරණය වීමේ අවදානම, පෙර ප්‍රතිශක්තිකරණයෙන් පසු අතුරු ආබාධයන්ට ලක්වූ කාණ්ඩ) ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ අත්‍යවශ්‍ය අංගයන් වේ. මෙකී අවදානමට ලක්විය හැකි කාණ්ඩ එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග වලින් ආරක්ෂා කිරීම සඳහා විශේෂ එන්නත් හා එන්නත් කාලසටහන් නිර්දේශ කරනු ඇත.

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ක්‍රියාවට නැංවීම අදාළ සියලු පාර්ශවකරුවන්ගේ වගකීම් පෙරදැරිව සිදු කරනු ලබන අඛණ්ඩ ක්‍රියාවලියකි. බෝවන රෝග පිළිබඳ ජාතික උපදේශක කමිටුව (NACCD), වසංගත රෝග විද්‍යා අංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, පවුල් සෞඛ්‍ය කාර්යාංශය (Family Health Bureau), සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය (Health Education Bureau), වෛද්‍ය පර්යේෂණ ආයතනය (Medical Research Institute), ශික්ෂණ හා පුහුණු ආයතන, අධ්‍යාපන ක්ෂේත්‍ර, පෞද්ගලික සෞඛ්‍ය

සේවා ආයතන, වෛද්‍ය වෘත්තිමය ආයතන, විශ්ව විද්‍යාල සහ අන්තර්ජාතික සංවිධාන (ලෝක සෞඛ්‍ය සංවිධානය/WHO, එක්සත් ජාතීන්ගේ ළමා ආරක්ෂණ අරමුදල/Unicef GAVI, සහ වෙනත්) යන සංවිධාන මෙම ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා දායක වේ.

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන පුළුල්ව පැතිරුණු සේවා ජාලයක් ඔස්සේ තම සේවාව මහජනතාවට පහසුවෙන් ලබා දීම සහතික කරයි. මහජනතාවගෙන් බහුතරය තම ප්‍රතිශක්තිකරණ සේවා අවශ්‍යතා ලබාගනු ලබන්නේ රාජ්‍ය අංශය තුළිනි. පසුගිය වසර කිහිපය තුළ පෞද්ගලික අංශයේ ප්‍රතිශක්තිකරණ සේවාවන් වල ක්‍රමාණුකූල වර්ධනයක්, විශේෂයෙන් නාගරික ප්‍රදේශ ආශ්‍රිතව සිදුව ඇත.

රාජ්‍ය අංශයේ නිදහස් ප්‍රතිශක්තිකරණ සේවාවේ අඛණ්ඩ පැවැත්ම සහතික කරන අතර වඩා කාර්යක්ෂම ප්‍රතිශක්තිකරණ සේවාවන් ලබා ගැනීම කෙරෙහි පෞද්ගලික අංශයේ දායකත්වයේ වැදගත්කම ශ්‍රී ලංකා රජය මගින් හඳුනාගෙන ඇත. මෙලෙස රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයෙන් ලබා දෙනු ලබන ප්‍රතිශක්තිකරණ සේවාවන් වල ඵලදායිතාව, සුරක්ෂිතභාවය හා ගුණාත්මක ප්‍රමිතිය සහතික කිරීමට නිසි පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම වැදගත්ය.

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා වූ වියදමින් 90% කටත් වඩා වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය දරනු ලබයි. මෙය ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ මූල්‍යමය ස්ථාවරභාවය සඳහා වූ ප්‍රබල සාක්ෂියකි. දැනට ලෝක සෞඛ්‍ය සංවිධානය, GAVI සහ Unicef යන ආයතන රටේ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට මූල්‍යමය දායක්තවය ලබා දෙන ප්‍රධාන ජාත්‍යන්තර සංවිධාන වේ. නව එන්නත් හා වඩා සුරක්ෂිත එන්නත් තාක්ෂණයක් හඳුන්වාදීම ඇතුළුව අනාගතයේ දී ව්‍යාප්ත වන ප්‍රතිශක්තිකරණ ක්‍රියාවන් සඳහා මූල්‍යමය දායකත්වයේ සැලකිය යුතු වැඩිවීමක් අවශ්‍ය වේ.

*ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තියේ දැක්ම*

ශ්‍රී ලංකාව ප්‍රජා සෞඛ්‍යයට වැදගත්, එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග වලින් තොර රටක් වීම.

*ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තියේ මෙහෙවර*

රටේ සියලුම ප්‍රතිශක්තිකරණයට යෝග්‍ය පුද්ගලයන්ට අවශ්‍ය ප්‍රතිශක්තිකරණ සේවාවන් ලබා දීම සඳහා සුදුසු පරිසරයක් සහතික කිරීම.

*ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තියේ අභිමතාර්ථය*

කලාපීය හා ගෝලීය අවශ්‍යතාවයනට අනුකූලව ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන මගින් නිර්ණය කරනු ලබන රටට අදාළ වූ එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග වලින් සියලු පුරවැසියන් ආරක්ෂා කිරීම.

*අරමුණු*

1. කල් පවත්නා හා සමානාත්මකතාවය මත පදනම් වූ ගුණාත්මක ප්‍රතිශක්තිකරණ සේවාවක පැවැත්ම සහ මූල්‍යමය ලෙස දැරිය හැකි බව සහතික කිරීම.
2. ප්‍රජාවේ සෞඛ්‍ය අවශ්‍යතා මත ඵලදයී, සුරක්ෂිත හා ගුණාත්මක එන්නත් කල් පවත්නා හා සමානාත්මතාවය මත පදනම්ව භාවිතය තුළින් ප්‍රජා සෞඛ්‍යයට වැදගත් එන්නත් මගින් වළකා ගත හැකි රෝග වලින් තොර වූ රටක් බවට පත් කිරීම.
3. විද්‍යාත්මක සාධක මත පදනම් වූ වඩාත් උචිත නව එන්නත් හඳුන්වා දීම සහතික කිරීම.
4. සියලු සේවාදායකයන් විසින් මනා අධීක්ෂණය, ඇගයීම, තොරතුරු කළමනාකරණය හා පර්යේෂණ මත පදනම්ව ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ක්‍රියාවට නැංවීම සහතික කිරීම.
5. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ මූල්‍යමය ස්ථාවරත්වය සහතික කිරීම.
6. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ පැවැත්ම හා සුරක්ෂිත භාවය සඳහා සැමගේ සහාය, ප්‍රවර්ධනය හා දැනුවත් බව තහවුරු කිරීම.
7. සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය මගින් ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය විධිමත් ලෙස ක්‍රියාවට නැංවීම.

*අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රමෝපායයන්*

*අරමුණු 1 - ප්‍රතිශක්තිකරණ සේවා*

කල් පවත්නා හා දැරිය හැකි වූ ගුණාත්මක ප්‍රතිශක්තිකරණ සේවාවක පැවැත්ම හා මුල්‍යමය ලෙස දැරිය හැකි බව සහතික කිරීම.

1.1 පුරවැසියන්ගේ හා ප්‍රජාවේ මූලික අයිතිවාසිකම් වලට අනුකූලව හා වලංගු වෛද්‍යමය හේතුවක් හැරණු කොට, ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ ව්‍යාප්තිත ප්‍රතිශක්තිකරණ වැඩසටහන (EPI) මගින් නිර්දේශිත සියලු එන්නත් අදාළ වයස් සීමාවන් තුළ අවම අවශ්‍යතාවය ලෙස ලබා දීම අනිවාර්ය වේ.

1.2 ප්‍රජාව උදෙසා ලබා දෙන සියලු ප්‍රතිශක්තිකරණ සේවාවන් සමානාත්මතාවය හා මුල්‍යමය වශයෙන් දැරිය හැකි පදනම මත විය යුතු ය.

1.3 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන මගින් සපයනු ලබන සියලුම ප්‍රතිශක්තිකරණ සේවා දීප ව්‍යාප්තිත සෞඛ්‍ය සේවා ජාලයක් ඔස්සේ සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ට ලබා ගත හැකි පරිදි ලබා දිය යුතු ය.

1.4 රටේ සියළුම ප්‍රතිශක්තිකරණය හා සම්බන්ධ කටයුතු වල හුදු තීරණ ගැනීමේ බලය සෞඛ්‍ය අමාත්‍යාංශය සතුය. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන කාලීනව තාක්ෂණික ඇගයීමට ලක් කර අවශ්‍ය නිර්දේශ ලබාදීම බෝවන රෝග පිළිබඳ ජාතික උපදේශක සභාව (NACCD) හා ප්‍රතිශක්තිකරණ වැඩසටහන කළමනාකරණ ආයතන විසින් සිදු කරනු ඇත.

1.5 සියලුම ප්‍රතිශක්තිකරණය සම්බන්ධ ක්‍රියාකාරකම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි හා පිළිගත් සායන මධ්‍යස්ථාන වලදී පමණක් සිදු කළ යුතු ය. මෙමගින් මහජනයාට විධිමත් ප්‍රතිශක්තිකරණ සේවාවක් සලසා දීම සඳහා අවශ්‍ය අවම පහසුකම් සියලුම ප්‍රතිශක්තිකරණ සායන මධ්‍යස්ථාන වල ඇති බවට සෞඛ්‍ය අමාත්‍යාංශය සහතික කරනු ඇත.

1.6 ප්‍රතිශක්තිකරණ සේවාවන් සලසනු ලබන සියලු පෞද්ගලික ප්‍රතිශක්තිකරණ සායන මධ්‍යස්ථාන, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ''ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා වූ ප්‍රතිශක්තිකරණ සායන මධ්‍යස්ථාන'' ලෙස ලියාපදිංචි විය යුතු අතර එම සායන මධ්‍යස්ථාන සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිර්දේශිත ප්‍රමිතීන්ට අනුකූලව සේවා පවත්වාගත යුතුය. මෙම කාර්යය පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනත/පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවට අනුව සිදු කළ යුතු ය.

1.7 ප්‍රතිශක්තිකරණ සේවාවන් ලබා ගන්නා සියලුම පුරවැසියන් වෙත ඵලදායී, සුරක්ෂිත හා ගුණාත්මක එන්නත් ලබාදීම තුළින් විධිමත් ප්‍රතිශක්තිකරණ සේවාවක් ලබාදීම තහවුරු කළ යුතුය.

1.8 එන්නත් ප්‍රවාහනය, ගබඩා කිරීම හා නික්ෂේපනය සිදු කරන තෙක් එන්නත් වල ශීතදාමය නිසි පරිදි ආරක්ෂා කිරීමට සියලුම ප්‍රතිශක්තිකරණ සේවාදායකයන් සහතික විය යුතු ය.

1.9 සියලුම භාවිතා කළ එන්නත් කුප්පි, සිරින්ජ සහ ප්‍රතිශක්තිකරණ ක්‍රියාවලියේදී එකතු වන සියලු නික්ෂේපණ අපද්‍රව්‍ය ජාතික පරිසර ප්‍රතිපත්තියට අනුකූලව සැකසූ නික්ෂේපණ අපද්‍රව්‍ය ආරක්ෂිතව බැහැර කිරීමේ ක්‍රියාවලියකට අනුව සිදු කළ යුතු ය.

1.10 ඵලදායී, සුරක්ෂිත හා ගුණාත්මක ප්‍රතිශක්තිකරණ සේවාවක් ලබා දීම උදෙසා ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන මගින් සම්පාදිත නීති රීති, රෙගුලාසි සහ උපදෙස් මාලා (guidelines) වලට සියලුම ප්‍රතිශක්තිකරණ සේවාදායකයන් අනුකූල විය යුතු ය.

1.11 සියලුම ප්‍රතිශක්තිකරණ සේවාදායකයින් ප්‍රතිශක්තිකරණය හා සම්බන්ධ සියලුම තොරතුරු ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට ලබාදිය යුතු ය.

1.12 අවදානමට ලක්විය හැකි සහ අධි අවදානම් පුද්ගල කාණ්ඩ අදාළ එන්නත් මගින් වලක්වා ගත හැකි රෝග වලට එරෙහිව ප්‍රමාණවත් ලෙස අවස්ථාවන්ට අනුකූලව ආරක්ෂා කරගත යුතු ය.

1.13 ආපදා අවස්ථා, වසංගත ආදී විශේෂ හදිසි අවස්ථාවලදී, සුදුසු ප්‍රතිශක්තිකරණ සේවාවන් කාලීනව ලබා දීම තුළින් අවදානමට ලක්වූ ජනතාව එන්නත් මගින් වළකා ගත හැකි රෝග වලින් ආරක්ෂා කරගත යුතු ය.

1.14 ආපදා හා වසංගත අවස්ථා වලදී පරිත්‍යාග ලෙස ලැබෙන සියලුම එන්නත් නිසි තත්ත්ව පරීක්ෂා හා ලියාපදිංචි ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු ය.

1.15 සියලුම දේශසීමා සංක්‍රමණිකයන් රටෙහි විශේෂිත අවශ්‍යතාවයන් හා ජාත්‍යන්තර රෙගුලාසි වලට අනුකූලව අදාළ එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග වලින් ආරක්ෂා කරගත යුතු ය.

1.16 සුදුසු ප්‍රතිශක්තිකරණ සේවා ලබා දීම තුළින් අවදානම ඇති වෘත්තීමය පුද්ගල කණ්ඩායම්, රැකියා ආශ්‍රිත එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග වලට ගොදුරු වීමේ අවදානමින් ආරක්ෂා කරගත යුතු ය. මෙය බෝවන රෝග පිළිබඳ ජාතික උපදේශක සභාවේ නිර්දේශයට අනුකූලව සිදුවිය යුතු ය.

1.17 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට, අදාළ සියලු පාර්ශවකරුවන් අතර සමීප සහයෝගීතාවය සහ සම්බන්ධතාවයක් පැවතිය යුතු ය.

1.18 ප්‍රතිශක්තිකරණ සේවාවන් සැපයීම හා සම්බන්ධ සියලු සේවාදායකයන් අපේක්ෂිත කාර්යය කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා සුදුසු නිපුණතාවයකින් යුක්ත විය යුතු ය.

1.19 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ උපදෙස්වලට අනුකූලව සේවා සිදු කරන ප්‍රතිශක්තිකරණ සේවාදායකයින් එම ක්‍රියාවලිය හා සම්බන්ධ එන්නත් අතුරු ආබාධ සම්බන්ධයෙන් වගකිවයුතු නොවේ.

1.20 සියලුම එන්නත් ප්‍රතිග්‍රාහකයින්ට දැනට පවත්නා විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව වයසට අදාළ, නිවැරදි මාත්‍රාවෙන් යුතුව නිවැරදි තාක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කරමින් එන්නත් ලබා දීම සහතික කළ යුතු ය.

1.21 එන්නත් වල ඵලදායීතාව, සුරක්ෂිතතාවය හා ගුණාත්මකභාවයට අදාළ තොරතුරු එන්නත් ප්‍රතිග්‍රාහකයන්ට ලබාදීමට ප්‍රතිශක්තිකරණ සේවාදායකයින් සහතික විය යුතු ය.

1.22 ප්‍රතිශක්තිකරණ ක්‍රියාවලිය නිසා යම් එන්නත් ප්‍රතිග්‍රාහකයෙක් සදාකාලික ආබාධිත තත්වයකට හෝ මරණයට ගොදුරු වූ බවට සාධක සහිතව තහවුරු වූ අවස්ථාවකදී එම පුද්ගලයාගේ සුබසාධනය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිචාර ක්‍රමවේදයන් අනුව සිදු විය යුතු ය.

1.23 අක්‍රිය ප්‍රතිශක්තිකරණය මගින් වලක්වාගත හැකි හා ප්‍රතිකාර කරනු ලබන රෝගී තත්වයනට අවශ්‍ය ආරක්ෂිත හා ගුණාත්මක අක්‍රිය ප්‍රතිශක්තිකරණ ඖෂධ වල පැවැත්ම සහතික කරනු ඇත.

*අරමුණ 2 - ඵලදායී, සුරක්ෂිත හා ගුණාත්මක එන්නත්*

මහජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතාවයන්ට අදාළ වන පරිදි ඵලදායී සුරක්ෂිත හා ගුණාත්මක එන්නත් කල්පවත්නා හා සාධාරණ ලෙස භාවිතය මගින් ශ්‍රී ලංකාව එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග වලින් තොර වූ රටක් බවට පත් කිරීම.

2.1 ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය හා පවත්වාගෙන යනු ලබන නිදහස් සෞඛ්‍ය සේවා මගින් රට තුළ තත්ත්වයෙන් උසස්, කාර්යක්ෂම හා සුරක්ෂිත එන්නත් වල පැවැත්ම තහවුරු කරයි.
2.2 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ භාවිත කරන එන්නත් පිරිවැය ඵලදායීතාවයෙන් යුක්ත විය යුතු ය.
2.3 ඵලදායී, සුරක්ෂිත හා ගුණාත්මක එන්නත් ජනතාවට මූල්‍යමය වශයෙන් දැරිය හැකි ලෙස ලබා දෙන්නාවූ පෞද්ගලික අංශයේ ප්‍රතිශක්තිකරණ සේවාවන්හි සම පැවැත්ම රජය මගින් පිළිගනු ලබන අතර එමගින් පුළුල්ව පැතිරුණු ප්‍රතිශක්තිකරණ සේවා අවස්ථාවන් සහතික කරනු ඇත.
2.4 ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියකින් තොරව කිසිදු එන්නතක් රට තුළ භාවිතා නොකළ යුතු ය.
2.5 ඕනෑම එන්නතක ලියාපදිංචිය මහජනතාවගේ සුභසිද්ධිය උදෙසා සිදුවිය යුතු ය. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ භාවිතා වන ඕනෑම නව එන්නතක හෝ එන්නත් සංයෝගයක ලියාපදිංචිය, බෝවන රෝග පිළිබඳ ජාතික උපදේශක කමිටුවේ නිර්දේශයට අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරිය මගින් සම්පාදිත පටිපාටියනට අනුකූලව සිදු විය යුතු ය.
2.6 අන්තර්ජාතික හෝ රාජ්‍ය නොවන සංවිධාන මගින් ප්‍රදානය කරනු ලබන හෝ සපයනු ලබන සියලුම එන්නත් ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
2.7 රාජ්‍ය අංශයේ භාවිතා කරනු ලබන සියලුම එන්නත් දැනට පවතින විද්‍යාත්මක තොරතුරු මත පදනම්ව ඒවායේ සුරක්ෂිතභාවය හා ප්‍රමිතියට නිසි අවධානය යොමු කරමින් රජයේ සම්මත සැපයුම් ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතු ය.
2.8 පෞද්ගලික අංශයේ භාවිතා වන සියලුම එන්නත් ඒවායේ සුරක්ෂිත භාවය හා ප්‍රමිතියට නිසි අවධානය යොමු කරමින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය ලත් එන්නත් ලියාපදිංචි ක්‍රියාවලිය අනුගමනය කළ යුතු ය.
2.9 සියළුම ප්‍රතිශක්තිකරණ සේවා සපයන්නන් ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ අන්තර්ගත සියලුම එන්නත්, බෝවන රෝග පිළිබඳ ජාතික උපදේශන කමිටුවේ අනුමැතිය ලත් එන්නත් ලබාදීමේ කාලසටහනට අනුව ලබාදිය යුතු ය.
2.10 භාවිතා කරනු ලබන එන්නත් වල ඵලදායිතාවය, සුරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය සහතික කිරීම පිණිස, අපනයනයේ සිට සේවා සැපයුම දක්වා එන්නත් වල ශීතදාමය පවත්වා ගැනීමට රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයතන යන දෙපාර්ශවයම කටයුතු කළ යුතු ය. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රතිශක්තිකරණ සේවාවන් සපයන ආයතන වල ශීතදාමය පවත්වා ගැනීමේ හැකියාව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය හා ප්‍රතිශක්තිකරණ වැඩසටහන කළමනාකරණ ආයතනය විසින් අධීක්ෂණයට හා ඇගයීමට ලක් කෙරෙනු ඇත.
2.11 එන්නත් නිසා ඇතිවිය හැකි අවදානම් තත්වයන් හා ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු එන්නත් ප්‍රතිග්‍රහකයාට ලබාදීමට ප්‍රතිශක්තිකරණ සේවා සපයන්නන් සහතික විය යුතු ය. මෙසේ ලබා දෙන අදාළ තොරතුරු සෞඛ්‍ය අමාත්‍යාංශයේ එකඟත්වය මත සිදුවිය යුතු ය.
2.12 කල් ඉකුත්වූ හා දෝෂ සහගත එන්නත් බැහැර කිරීම, ජාතික පරිසර ප්‍රතිපත්තිය හා ඖෂධ නියාමන අධිකාරිය පනතට අනුකූලව සැකසූ වෛද්‍යමය අපද්‍රව්‍ය ආරක්ෂාකාරීව බැහැර කිරීමේ ක්‍රියාවලියකට අනුකූලව සිදු කළ යුතු ය.
2.13 ජාතික ඖෂධ නියාමන අධිකාරිය, ජාතික තත්ව පාලන රසායනාගාරය (වෛද්‍ය පර්යේෂණායතනය) සහ ප්‍රතිශක්තිකරණ වැඩසටහන කළමනාකරණ ආයතනය (වසංගත රෝග විද්‍යා අංශය) මගින් සිදුකරන ආවේක්ෂණය, අධීක්ෂණය හා ඇගයීම මගින් එන්නත් වල ඵලදායීතාවය, සුරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය ආරක්ෂා කරනු ඇත.

*අරමුණු 3 - නව එන්නත් හඳුන්වා දීම*

තර්කාන්විතව හා විද්‍යාත්මක සාධක මත පදනම්ව නව එන්නත් හඳුන්වා දීම සහතික කිරීම.

3.1 රටෙහි පවතින එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග වල වසංගතවේදය අධ්‍යයනය කර ලබා ගන්නා විද්‍යාත්මක සාධක මත හා කලාපීය හා ගෝලීය අවශ්‍යතාවයන් පදනම්ව ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන කලින් කලට සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතු ය.

3.2 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට නව එන්නත් හඳුන්වාදීම සහ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ වෙනස්කම් සිදුකළ යුත්තේ විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගෙනය.

3.3 නව එන්නත් හඳුන්වා දීම හා සම්බන්ධ සියලුම පර්යේෂණ කටයුතු විද්‍යානුකූල ක්‍රමවේදයන්ට අනුව, සම්මත සායනික පුරුදු හා සම්මත ආචාරධර්ම ක්‍රියාවලියට (ethical clearance process) (සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලත් ආචාර ධර්ම කමිටුවක් හරහා) අනුකූලව සිදුකළ යුතු අතර එම පර්යේෂණ වාර්තා නිසියාකාරව හා කාලීනව අදාළ පාර්ශවකරුවන් අතර බෙදා හැරිය යුතු ය. මීට අමතරව සියලුම එන්නත් වලට අදාළ සායනික පර්යේෂණ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය ඇතිව සිදු කළ යුතු ය.

3.4 එන්නත් සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ වැදගත් අංගයක් වනු ඇත.

3.5 එන්නත් සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය තුළින්, ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට අවශ්‍ය පිරිවැය ඵලදායිතාවයෙන් යුත් ආරක්ෂිත හා ගුණාත්මක එන්නත් රටතුළම නිපදවීම පිළිබඳව නිසි අවධානය යොමු කරනු ඇත.

*අරමුණ 4 - ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ක්‍රියාවට නැංවීම*

මනා අධීක්ෂණය, ඇගයීම, තොරතුරු කළමනාකරණය හා ප්‍රතිශක්තිකරණ ක්ෂේත්‍රයේ පර්යේෂණ මත පදනම්ව සියලු සේවාදායකයන් විසින් ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ක්‍රියාවට නැංවීම සහතික කිරීම.

4.1 ප්‍රතිශක්තිකරණ වැඩසටහන කාර්යක්ෂම ලෙස අධීක්ෂණය හා ඇගයීම සිදුකිරීම සඳහා අවශ්‍ය තොරතුරු ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට ලබාදීමට සියලු ප්‍රතිශක්තිකරණ සේවාදායකයන් කටයුතු කළ යුතු ය.

4.2 සියලුම සෞඛ්‍ය සේවාදායකයින් විසින් එන්නත් වලින් ඇතිවිය හැකි අතුරු ආබාධ වලට ලක්වූ රෝගීන් හා එන්නත් වලින් වළක්වා ගත හැකි රෝගවලට ලක්වී යැයි සායනිකව සැක කළ රෝගීන් පිළිබඳ තොරතුරු අදාළ උපදෙස් වලට අනුකූලව ජාතික රෝග ආවේක්ෂණ පද්ධතිය හරහා ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට දැනුම් දිය යුතු ය.

4.3 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන මගින් ප්‍රතිශක්තිකරණයෙන් පසුව වාර්තා වන සියලුම බරපතල අතුරු ආබාධ විමර්ශනය කරනු ලැබේ. තවද එමගින් ජාතික රෝග ආවේක්ෂණ පද්ධතිය හරහා වාර්තා වන සායනිකව තහවුරු කළ එන්නත් මගින් වළක්වා ගත හැකි සියලු රෝග ද විමර්ශනයට ලක් කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

4.4 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය අදාළ බලධාරීන් විසින් අධීක්ෂණයට හා ඇගයීමට ලක් කරනු ඇත.

4.5 තනි පුද්ගලයෙකුට, පුද්ගල කාණ්ඩවලට හෝ සේවාදායකයින්ට බලපාන ප්‍රතිශක්තිකරණයට අදාළ තොරතුරු වල රහස්‍යභාවය සෑම මට්ටමකදීම ආරක්ෂා කර ගැනීම සහතික කරනු ඇත.

4.6 එන්නත් හා සම්බන්ධ සියලුම පර්යේෂණ විද්‍යානුකූල ක්‍රමවේදයනට අනුව, සම්මත සහ සායනික පුරුදු හා සම්මත ආචාරධර්ම (ethical clearance process) මත පදනම් විය යුතු අතර එම පර්යේෂණ වල ප්‍රතිඵල නිසියාකාරව හා කාලීනව අදාළ පාර්ශවකරුවන් අතර බෙදා හැරිය යුතු ය.

4.7 ප්‍රතිශක්තිකරණ වැඩසටහන හා සම්බන්ධ තීරණ ගැනීමේදී විද්‍යාත්මක පර්යේෂණ ප්‍රතිඵල, ප්‍රතිශක්තිකරණයෙන් පසුව ඇතිවන අතුරු ආබාධ පිළිබඳ ආවේක්ෂණ දත්ත, පසු බලපත්‍ර දත්ත හා එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග පිළිබඳ ආවේක්ෂණ දත්ත අදාළ පාර්ශවකරුවන් අතර හුවමාරු කර ප්‍රයෝජනයට ගත යුතු ය.

*අරමුණ 5 - මූල්‍යමය ස්ථාවරත්වය*

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ මූල්‍යමය ස්ථාවරත්වය සහතික කිරීම

5.1 ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ මූල්‍යමය ස්ථාවරත්වය පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා රජය බැඳී සිටියි. ඵලදායී, සුරක්ෂිත හා ගුණාත්මක එන්නත් සහ අනෙකුත් සැපයුම් (logistics) කාලීන ලෙස සැපයීම සඳහා ප්‍රමාණවත් මූල්‍යමය ප්‍රතිපාදන ශ්‍රී ලංකා රජය මගින් සලසා දෙනු ඇත.

5.2 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ මූල්‍යමය ස්ථාවරත්වය සහතික කිරීම පිණිස ජාතික අයවැයෙන් ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහාම වෙන්වූ මූල්‍යමය ප්‍රතිපාදන වෙන්කරනු ඇත. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ පරමාර්ථයෙන් මෙසේ වෙන් කරනු ලබන මූල්‍යමය ප්‍රතිපාදන වාර්ෂිකව සමාලෝචනයට ලක් කරනු ඇත.

5.3 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පළාත් මට්ටමින් ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙල අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා සියලු පළාත් බලධාරීන් විසින් අවශ්‍ය ප්‍රතිපාදන හා සම්පත් ප්‍රමාණවත්ව හා කාලීනව සැපයෙන බවට තහවුරු කරනු ඇත.

5.4 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන හා එහි අරමුණු වලට අනුකූලව එම වැඩසටහන තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා මූල්‍යමය ආධාර ලබා ගැනීමට ඇති හැකියාව රජය විසින් සොයා බලනු ඇත.

5.5 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ මූල්‍ය ස්ථාවරත්වය නිරතුරුවම අධීක්ෂණය කිරීම සඳහා වූ යාන්ත්‍රණයක් සකසනු ඇත.

*අරමුණු 6 - උද්දේශනය හා ප්‍රවර්ධනය*

ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ නිත්‍යානුකූල භාවය, ප්‍රවර්ධනය, දැනුවත් බව හා සුරක්ෂිත භාවය තහවුරු කිරීම.

6.1 එන්නත් හා ප්‍රතිශක්තිකරණය සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා ජනතාවට ඇති අයිතිය පිළිගනු ඇත.

6.2 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට අදාළ එන්නත් මගින් ප්‍රතිශක්තිකරණ සිදු කිරීමේ වැදගත්කම ප්‍රතිලාභ හා වයසට අනුකූල ලෙස ප්‍රතිශක්තිකරණය සිදුකිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ප්‍රජාවගේ දැනුවත්භාවය ප්‍රවර්ධනය කළ යුතු ය.

6.3 සියලුම සෞඛ්‍ය සේවා පද්ධති (රාජ්‍ය, පෞද්ගලික, බටහිර, දේශීය සහ අනෙකුත්) ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ප්‍රවර්ධනයට, ආරක්ෂා කිරීමට හා ආධාර කිරීමට කටයුතු කරනු ඇත.

6.4 ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන හා ප්‍රතිශක්තිකරණ ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහත සියලුම සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ හැකියාව ගොඩනැගීම දිරිමත් කරනු ලැබේ.

6.5 සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාවට නංවනු ලබන ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ප්‍රවර්ධනය, ආරක්ෂා කිරීම හා ආධාර කිරීම උදෙසා අධ්‍යාපන ක්ෂේත්‍රය, මාධ්‍ය ආයතන, ප්‍රජා සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, අන්තර්ජාතික සංවර්ධන පාර්ශවකරුවන් සහ අනෙකුත් අදාළ සංවිධාන මගින් සිදුකරන වැදගත් කාර්යභාරය රජය විසින් පිළිගනු ලැබේ.

6.6 පාසල් හා පෙර පාසල් ද ඇතුළත්ව සියලුම අධ්‍යාපන ආයතනවල බලධාරිහු (රාජ්‍ය හා පෞද්ගලික යන දෙපාර්ශවයම) ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ ක්‍රියාවන් ප්‍රවර්ධනය කිරීම හා ආධාර කිරීම සිදුකරනු ඇත. පාසල් වලට ඇතුළත් කිරීමේ දී දරුවන්ගේ එන්නත්කරණ තත්වය ඇගයීමට ලක් කරනු ලබන අතර හඳුනාගත් එන්නත් අසම්පූර්ණතා සපුරාලනු ඇත.

6.7 ජනතාවගේ සුභසිද්ධිය උදෙසා, ප්‍රතිශක්තිකරණය සම්බන්ධ සියලුම කාරණා තර්කාන්විතව හා වගකීමෙන් යුක්තව වාර්තා කිරීම ධෛර්යමත් කිරීම පිණිස මාධ්‍ය සංවිධාන සමග සංවාද නිරතුරුව ඇති කරගනු ඇත.

6.8 එන්නත් සැපයුම්කරුවන් හා සේවා සපයන්නන් සියලුම එන්නත් හා ප්‍රතිශක්තිකරණ සේවා ප්‍රවර්ධන කිරීමේදී ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ආරක්ෂා කිරීම හා ආධාර දීම සහතික කිරීම සඳහා පිළිගත් එන්නත් වෙළඳ ආචාරධර්ම වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

*අරමුණ 7 - ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම*

සියලු පාර්ශවකරුවන් ඇතුලත්ව ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය ඉතාමත් විධිමත් ලෙස ක්‍රියාවට නැංවීම හා ගුණාත්මක ප්‍රතිශක්තිකරණ සේවාවක් ලබා දීම සඳහා ප්‍රතිශක්තිකරණ සේවාදායකයින් පුහුණු කිරීම

7.1 ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියේ අභිමතාර්ථ, අරමුණු රාමුව තුළ ක්‍රියාවට නංවනු ඇත.

7.2 ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවනු ලබන්නේ ක්‍රමෝපායික සැලැස්මක් හරහා ය.

7.3 පාර්ලිමේන්තු පනතක් මගින් සම්මත නෛතික රාමුවක් තුළ ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම ශක්තිමත් කරනු ඇත.

7.4 ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය හා ඇගයීම සඳහා නිසි බලධරයා වන්නේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්තුමාය. ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී බෝවන රෝග සඳහා වන ජාතික උපදේශක කමිටුවේ අදහස් විමසා උපදෙස් ලබා ගැනීම සිදු කරනු ඇත.

7.5 පළාත් සෞඛ්‍ය සේවා බලධාරීන් විසින් තම පළාත් වල ප්‍රතිශක්තිකරණය හා සම්බන්ධ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමේදී ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තියට හා ක්‍රමෝපායික සැලැස්මට අනුගත විය යුතු ය.

7.6 මහජන පශු සෞඛ්‍ය සේවාව මගින් එන්නත් මගින් වළක්වා ගත හැකි රෝග පාලනය කර ගැනීමේ කටයුතු වල නිරත වීමේදී ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තියට අනුගත විය යුතු ය.

7.7 ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය හා ක්‍රමෝපාය සැලැස්ම ජාතික හා පළාත් සෞඛ්‍ය බලධාරී විසින් ක්‍රියාවට නැංවෙනු ඇත. තවද ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම රජයේ විවිධ අමාත්‍යාංශ, රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා ජාතික හා අන්තර්ජාතික සංවිධානයන් අතර මනා සම්බන්ධීකරණයෙන් හා සහයෝගයෙන් යුතුව සිදු කෙරෙනු ඇත.

7.8 ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ඵලදායී අධීක්ෂණ යාන්ත්‍රණයක් මගින් නිරන්තර අධීක්ෂණයට හා සමාලෝචනය කිරීමට ලක් කරනු ඇත. ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය සඳහා අධීක්ෂණ නිර්ණායක සැකසෙනු ලැබෙන අතර එමගින් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කෙරෙනු ඇත.

7.9 ජාතික ප්‍රතිශක්තිකරණ ප්‍රතිපත්තිය කලින් කළට සමාලෝචනය කෙරෙනු ලබන අතර එය ජාතික හා මහජන සෞඛ්‍ය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කෙරෙනු ඇත.

01 - 526

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.